“ඔබ සවස් කාලයට එළැඹෙන විට හා උදෑසන කාලයට එළැඹෙන විට ‘කුල් හුවල්ලාහු අහද්’ සහ ‘මුඅව්විදතෙයින්’ (ෆලක් හා නාස් නම් සූරා දෙක) තුන්වරක් පාරායනය කරන්න. සියලු දේට වඩා එය ඔබට ප්රමාණවත් වනු ඇත යැයි පැවසූ බවට ප්රකාශ කර සිටියේය

අබ්දුල්ලාහ් ඉබ්නු හුඃබෙයිබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. අපි වැසි සහිත ඝනාඳුරු රාත්රියක අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව සොයමින් පිටත්ව ගියෙමු. එය එතුමාණන් අපට සලාතය මෙහෙය වීම පිණිසය. හෙතෙම, මම එතුමණන්ව මුණ ගැසුණෙමි. එවිට එතුමා 'පවසනු' යැයි පැවසූහ. මම කිසිවක් නොපැවසුවෙමි. පසුව එතුමාණෝ නැවතත් 'පවසනු' යැයි පැවසූහ. පසුව ද මම කිසිවක් නොපැවසුවෙමි. පසුව එතුමාණෝ නැවතත් 'පවසනු' යැයි පැවසූහ. මා පැවසිය යුත්තේ කුමක් දැයි මම විමසුවෙමි. එතුමාණෝ: “ඔබ සවස් කාලයට එළැඹෙන විට හා උදෑසන කාලයට එළැඹෙන විට ‘කුල් හුවල්ලාහු
අහද්’ සහ ‘මුඅව්විදතෙයින්’ (ෆලක් හා නාස් නම් සූරා දෙක) තුන්වරක් පාරායනය කරන්න.
සියලු දේට වඩා එය ඔබට ප්රමාණවත් වනු ඇත යැයි පැවසූ බවට ප්රකාශ කර සිටියේය.
[صحيح] [رواه أبو داود والترمذي والنسائي]

කීර්තිමත් සහාබිවරයකු වන අබ්දුල්ලාහ් ඉබ්නු හුඃබෙයිබ් (රළියල්ලාහු අන්හු) තුමා පවසයි. ඔවුන් අධික වැසි සහිත ඝනාඳුරු රාත්රියක අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සොයමින් පිටත්ව ගියෝය. එය එතුමාණන් ඔවුනට සලාතය මෙහෙය වීම පිණිසය. එවිට ඔවුහු එතුමාණන්ව මුණ ගැසුණෝය. එවිට එතුමාණෝ 'පවසනු' එනම් 'කියවනු' යැයි ඔහුට පැවසූහ. නමුත් ඔහු කිසිවක් කියෙව්වේ නැත. එම ප්රකාශයම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඔහුට නැවත නැවතත් පවසා සිටියහ. එවිට අබ්දුල්ලාහ්: 'අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! මා කියවිය යුත්තේ කුමක් දැ?'යි විමසා සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ උදෑසන කාලයේ හා සවස් කාලයේ ‘කුල් හුවල්ලාහු අහද්’ සහ ‘මුඅව්විදතෙයින්’ (කුල් අඌදු බිරබ්බිල් ෆලක් සහ කුල් අඌදු බිරබ්බින් නාස් නම් සූරා දෙක) තුන්වරක් පාරායනය කරන්න. එය සියලු උවදුරුවලින් ඔබව ආරක්ෂා කරනු ඇත. සියලු නපුරුකම්වලින් ඔබව මුදවනු ඇත.' යැයි පැවසුහ.

http://sunnah.global/hadeeth/si/show/6082